Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**


**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**


**ප්‍රශ්න පත්‍ර අංක 03 - I පත්‍රය**


**විභාග අංකය : ........................................ කාලය පැය :- 1යි.**


- හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.


(01) 



(i)



(ii)


(iii)


(02) 


(i)


(ii)


(iii)

(03) මෙම රූප තුනට ම අදාළ ප්‍රකාශය තෝරන්න.










(i) ශ්‍රව්‍ය (ii) දෘශ්‍ය (iii) ශ්‍රව්‍ය / දෘශ්‍ය

- රටා අනුව හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(04)













(i) 64 (ii) 100 (iii) 121

(05)




(i) 12 (ii) 10 (iii) 15

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(06) මහරගම යන වචනය සංකේත ඇසුරින් දක්වා ඇත්තේ △▯○✳△ ආකාරයට ය. ඒ අනුව "මනහර" යන වචනයේ සංකේත යෙදී ඇති පිළිතුර තෝරන්න.


(i) △□▯○ (ii) △○▯✳ (iii) △○✳▯

(07) පහත රූපසටහන පිළිබඳ නොගැළපෙන ප්‍රකාශය වන්නේ,




(i) කූඩුව තුළ සිටින සතුන් ගණන දෙකකි.
(ii) මෙහි සිටින සතුන් ගණන හයකට වඩා වැඩි ය.
(iii) මෙහි සිටින සීබ්‍රාවුන් ගණන දෙකකි.

(08) පහත රූපයට අනුව කොමඩු ගෙඩිවල බර වන්නේ,




(i) 3kg (ii) 2kg 700g (iii) 3kg 300g


(09)



මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන වන්නේ,


(i) 5 (ii) 6 (iii) 8

(10) මෙම සටහන අනුව A ස්ථානයට යෙදිය හැකි සංඛ්‍යාව වන්නේ,




(i) 9, 18
(ii) 12, 24
(iii) 8,16

- **පහත දැක්වෙන ඝනකාකාර ලී කුට්ටිය වටේ තීන්ත ආලේප කර කුඩා ඝනකවලට වෙන්කර ගනී.**




(11) පැති දෙකක පමණක් තීන්ත ආලේප වී ඇති ඝනක ගණන වන්නේ,

(i) 24 (ii) 16 (iii) 20

(12) එක් පැත්තකවත් තීන්ත ආලේප වී නොමැති ඝණක ගණන වන්නේ,

(i) 16 (ii) 12 (iii) 8

(13) පහත සංඛ්‍යා පුවරු ආරෝහණ ක්‍රමයට සකස් කිරීමේ දී ස්ථානය වෙනස් වන පුවරු ගණන කීය ද?





(i) හතරයි (ii) තුනයි (iii) දෙකයි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(14) පබළු වැලක පබළු අමුණා ඇත්තේ රතු පබළු දෙකකට පසුව නිල් පබළු දෙකක් එන ලෙසිනි. ආරම්භයේ සහ අවසානයේ රතු පබළු අමුණා ඇත. එහි නිල් පබළු 15ක් අමුණා ඇත්නම් පබළු වැලේ ඇති පබළු ගණන කීය ද?

(i) 12 (ii) 27 (iii) 15

(15) පහත සැමන් ටින් එකෙහි පිටින් අලවා ඇති දවටනය තිත් ඉර දිගේ සරල රේඛීයව කපා දිග හැරිය විට සෑදෙන හැඩතලය වන්නේ,



(i) ඍජුකෝණාස්‍රයකි.

(ii) වෘත්තයකි.

(iii) සමචතුරස්‍රයකි.

(16) මාලා පෙරවරු 7.00 සිට පස්වරු 2.00 දක්වා ද තමරා පෙරවරු 10.00 සිට පස්වරු 4.00 දක්වා ද විහාරා පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ද මහජන පුස්තකාලයේ රැඳී සිටියේ නම් තිදෙනා ම එක විට පුස්තකාලයේ රැඳී සිටි කාලය කොපමණ ද?

(i) පැය 05 (ii) පැය 04 (iii) පැය 02

(17) තොරණක රතු බල්බ මිනිත්තු හතරකට වරක් දැල්වේ. නිල් බල්බ මිනිත්තු 10කට වරක් ද, කහ බල්බ මිනිත්තු 12කට වරක් ද දැල්වෙන අතර තොරණ ආරම්භයේ දී සියලු බල්බ දැල්වේ. තොරණේ ආරම්භය පස්වරු 6.30 ට නම් නැවත සියලු බල්බ එකවර දැල්වෙන්නේ කුමන වේලාවට ද?

(i) පස්වරු 7.30 (ii) පස්වරු 6.45 (iii) පස්වරු 7.00

(18) පියුමි තම යෙහෙළියන්ට ඡායාරූපයක් පෙන්වමින් මෙහි සිටින්නේ මාගේ අත්තම්මාගේ දියණියගේ එක ම දියණිය යැයි ප්‍රකාශ කළා ය. එම ඡායාරූපයේ සිටින්නේ,

(i) පියුමිගේ මව (ii) පියුමිගේ දුව (iii) පියුමි

(19) වෙළඳසැලක සබන් කැට අසුරා ඇත්තේ උඩ ම පේළියේ සිට පහළ පේළිය දක්වා එක බැගින් වැඩිවන ආකාරයට ය. උඩ ම පේළියේ සබන් කැට එකකි. සබන් කැට අසුරා ඇති පේළි ගණන 8 ක් නම් මුළු සබන් කැට ගණන කීය ද?

(i) 36 කි. (ii) 30 කි. (iii) 18 කි.

(20) පොකුණක පාසි වැවෙන්නේ පළමු දින මෙන් දෙගුණයක් දෙවන දිනයේ ද දෙවන දිනයේ මෙන් දෙගුණයක් තෙවන දිනයේ ද වන ආකාරයට ය. පොකුණේ හරි අඩක් පාසි වැවීමට දින 8ක් ගත වේ නම් සම්පූර්ණ පොකුණ පාසිවලින් වැසීමට යන දින ගණන වන්නේ,

(i) දින 16 යි. (ii) දින 9 යි. (iii) දින 10 යි.

(21) මිතුරන් පස්දෙනෙකු එකිනෙකාට අතට අත දෙනු ලැබේ. ඒ අනුව සියලු දෙනා ම අතට අත දෙන මුළු වාර ගණන කීය ද?

(i) 10 (ii) 8 (iii) 12

(22) පාදයක් 9cm වන සමචතුරස්‍රාකාර හැඩයක් ඇති කම්බියක් දිග හැර සමපාද ත්‍රිකෝණයක් සෑදුවහොත් පාදයක දිග වන්නේ,

(i) 36 cm (ii) 12 cm (iii) 9 cm

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(23) විභාග ප්‍රශ්න පත්‍රයකට ප්‍රශ්න 40 කි. නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු දෙකක් ලැබෙන අතර වැරදි පිළිතුරකට ලබාගත් ලකුණුවලින් ලකුණු 1 බැගින් අඩු වේ. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියා ප්‍රශ්න 33ක් නිවැරදි නම් ලැබිය යුතු ලකුණු ගණන වන්නේ,

(i) 66 (ii) 73 (3) 59

(24) අජිත් සහ කමල්ගේ බරෙහි එකතුව 65 kg වේ. අජිත් සහ සමිත්ගේ බරෙහි එකතුව 75 kg වේ. මෙම තිදෙනාගේ ම බරෙහි එකතුව 105 kg ක් වේ නම් කමල්ගේ බර කොපමණ ද?

(i) 30 kg (ii) 35 kg (iii) 40 kg


(25) මම සංඛ්‍යාවක් සිතුවෙමි. එයට පහක් එකතු කර ලැබෙන පිළිතුරෙහි දෙගුණයෙන් එකක් අඩු කළ විට පිළිතුර 33 වේ. මා සිතූ සංඛ්‍යාව කුමක් ද?

(i) 34 (ii) 17 (iii) 12

(26) එකේ සිට අසූ අට (88) තෙක් සංඛ්‍යා ලිවීමේ දී අටේ ඉලක්කම යෙදෙන වාර ගණන වන්නේ,

(i) 16 (ii) 17 (iii) 18

•





(27) ඉහත රූපයට අනුව "○" හි අගය වන්නේ,

(i) 15 (ii) 7 (iii) 6

(28) මෙහි "?" ලකුණ යෙදෙන ස්ථානයට ලැබෙන අගය වන්නේ,

(i) 17 (ii) 18 (iii) 15

• **පහත ඝනක ඇසුරින් පිළිතුරු සපයන්න.**




(29) E ට විරුද්ධ පැත්තේ ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,


(i) F (ii) A (iii) B

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(30) D අකුරට විරුද්ධ පැත්තේ F අක්ෂරය නම් C අකුරට විරුද්ධ පැත්තේ ඇති ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

(i) A (ii) F (iii) B

(31)



කුඩා දරුවෙක් කුඩා ඝනක යොදාගෙන කළ නිර්මාණයක් ඉහත දැක්වේ. එය ඝනකයක් බවට පත්කිරීමට තව කුඩා ඝනක කොපමණ අවශ්‍ය ද?

(i) 27 (ii) 18 (iii) 9


(32) සුපුන් උතුරු දිශාවට මීටර 10ක් ගමන් කර නැගෙනහිර දිශාවට හැරී මීටර 15ක් ඉදිරියට ගමන් කර නැවත දකුණු දිශාවට හැරී මීටර 20ක් ගමන් කර නවතී. දැන් සුපුන් සිටින්නේ ආරම්භක ස්ථානයට කුමන දිශාවෙන් ද?

(i) නැගෙනහිර (ii) දකුණ (iii) ගිනිකොණ

(33) සමචතුරස්‍රාකාර කඩදාසියක් ගෙන එය හතර වාරයක් එක මත එක නැමුවහොත් කුඩා සමචතුරස්‍ර කීයක් ලැබෙයි ද?

(i) 4 (ii) 16 (iii) 8

(34)




මෝටර් රථය A සිට පැයට 50km වේගයෙන් ද ජීප් රථය B සිට පැයට 40 km වේගයෙන් ද එකවර ගමන් අරඹති. වාහන දෙක මුණ ගැසෙන්නේ ගමන් අරඹා කුමන වේලාවකට පසුව ද?


(i) පැය 1.20 (ii) පැය 2 (iii) පැය බාගයක්

(35) මීටර 100 ක් දිග තාප්පයක මීටර හතරෙන් හතර බල්බ සවිකර ඇත. සවිකර ඇති බල්බ ගණන කීය ද?


(i) 25 (ii) 26 (iii) 27

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


(36) 12.30ට පැය දෙකකට පෙර වේලාව සඳහන් වන ඔරලෝසුවක් කැඩපතකින් බැලූ විට පෙනෙන ආකාරය වන්නේ,



(i)



(ii)



(iii)

(37) දුම්රියක නිදන මැදිරිය පිහිටා ඇත්තේ පළමු මැදිරියේ සිට 15වන මැදිරිය වන අතර අවසාන මැදිරියේ සිට 6 වන මැදිරියයි. දුම්රියේ ඇති මැදිරි සංඛ්‍යාව කීය ද?

(i) 20 (ii) 21 (iii) 19


(38) පෙරේදාට පෙර දවස සඳුදා නම් අනිද්දාට පසු දවස වන්නේ,

(i) අඟහරුවාදා (ii) සෙනසුරාදා (iii) ඉරිදා

(39) වෙළෙන්දෙක් දිවුල් ගෙඩි 100 ක් රු.2000.00 ක් දී මිල දී ගත්තේ ය. ඔහු ඒ ගෙඩි සියල්ල විකුණා අවසන් වූ විට රුපියල් 1000.00 ක ලාභයක් ලබා තිබුණි. දිවුල් ගෙඩියක් විකුණූ මිල කීය ද?

(i) රුපියල් 20.00 (ii) රුපියල් 30.00 (iii) රුපියල් 10.00

(40)



මෙහි අඳුරු නොකළ කොටස සම්පූර්ණ රූපයෙන් කොපමණ ප්‍රමාණයක් ද?

(i) $\frac{2}{9}$ (ii) $\frac{7}{9}$ (iii) $\frac{2}{3}$

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.**

**5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024**

**ප්‍රශ්න පත්‍ර අංක 03 - II පත්‍රය**

**විභාග අංකය : .................................. කාලය : පැය1යි මිනිත්තු 15 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඡේදය ඇසුරෙන් ම පිළිතුරු සපයන්න.

සිසිර ඉසුඹුවට පසු සිසුහු පාසල වෙත පැමිණිය හ. විස්මිත දෙයක් දක්නට ලැබී ඔවුහු සතුටෙන් කෑ ගසන්නට වූහ. පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් රැස්වීම් හල අසල මල් පාත්ති පසුපස, නව මැදිරිය නැගී සිටියේ ය. ඔවුන් නොසිටි දිනවල එය පොත්ගුලක් බවට පෙරළී තිබිණ. සියලු ම දෙනා ගරු කළ, හැම වැඩක් ම කිරීමට සමත් මුරකරු වූ රියෝ චං බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කර තිබිණි. පොත් රාක්ක විශාල ගණනක් සවි කොට, සියලු ම වර්ගවල වර්ණවත් පොත් පේළිවලින් ඒවා පුරවා තිබිණ. හිඳගෙන කියවීම සඳහා පුටු සහ මේස තබා තිබිණි.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(I) හැම වැඩක් ම කිරීමට සමත් වූ මෙහි සඳහන් පුද්ගලයාගේ නම කුමක් ද? ..................................

(II) `පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් නැගී තිබුණේ කුමක් ද? ..................................

(III) ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ, බහුවචන, අනුක්ත නාමපදය කුමක් ද? ..................................

(IV) පෙරළී යන වචනයේ ඉරි ඇඳි අකුරෙහි යෙදී ඇති පිල්ලම නම් කරන්න. ..................................

(V) සඤ්ඤක අකුරක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. ..................................

(VI) පුස්තකාලය යන අදහස සහිත ඡේදයේ යෙදී ඇති වචනය කුමක් ද? ..................................

(02) පහත සඳහන් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද වරහන තුළ යොදන්න.

(I) ගැල් කණ්ඩායම දැකුම්කලු විශාල වෘක්ෂයක් දුටුවේ ය. (     )

(II) ඔවුන් උදෑසනින් ම කුඹුරට ගිය හ. (     )

(III) ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. (     )

(03) අතීත කාල බහුවචන ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(I) (i) නටති (ii) විසුවේ ය (iii) කළ හ.

(II) (i) වූහ (ii) කරති (iii) බලන්නෙහු

(04) දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් තනන්න.

සංවේදීතාව / ඉවහල් / සාර්ථකත්වය / පරිසරය / කෙරෙහි / නිර්මාණකරණයේ / වික්‍රමසිංහ / සඳහා / විය / දැක්වූ / මහතාගේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(05) පහත වචනවල හිස්තැනට සුදුසු නිවැරදි අක්ෂරය තෝරා හිස්තැනෙහි ලියන්න.

(I) විශේ.......ණ (ෂ/ශ)

(II) සංරක්ෂ....... (න/ණ)

(III) .......යකරු (ණ/න)

(IV) වාර්....... (තා/ථා)

(V) සාකච්.......ච (චා/ඡා)

(VI) ආරූ....... (ඪ/ඨ)

(06) පහත සඳහන් වාක්‍යය ලිඛිත බසට හරවා ලියන්න.

අපි මල් කඩා මාල හැදුවා.

..............................................................................................

(07) ගැළපෙන වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

| |
|---|
| නළ , නල , වණය , වනය |

(I) තුවාලය යන අර්ථය දෙන පදය ..........................................

(II) කැලය යන අර්ථය දෙන පදය ..........................................

(III) බටය යන අදහස දෙන පදය ..........................................

(IV) සුළඟ යන අදහස දෙන වචනය ..........................................

(08) පහත අදහස දෙන ප්‍රස්ථාව පිරුළ ලියන්න.

(I) දැනටමත් උග්‍ර වී ඇති ප්‍රශ්නයක් තවදුරටත් උග්‍ර කිරීම.

..............................................................................................................................

(II) ගැළපෙන අදහස් හා ගතිගුණ ඇති දෙදෙනෙකු සඳහා යෙදේ.

..............................................................................................................................


(09) සුදුසු විරාම ලකුණු යොදන්න.

(I) සිබිල් නැන්දා හෙවත් සිබිල් වෙත්තසිංහ මැතිණිය එදා ඒ සිහින දුටු කුඩා දැරියයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(10) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය තිත් ඉර මත ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

(I) 

(II) 

.................................... ....................................

(11) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

I have / Do / pencil / you / a ?

..........................................................................................

(12) ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(I) National Dress - ............................................................

(13) 'පාට්ටි මාර්' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..............................................................................

(14) පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

(I) මට බඩගිනියි - ............................................................

- **තිත් ඉර මත පිළිතුර ලියන්න.**

(15) ''දහහත් දහස් දහ නවය'' මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.......................................................................................... (ලකුණු 01)

(16) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න.

3026 , 30106 , 3100

.......................................................................................... (ලකුණු 02)

(17) පහත දී ඇති සංඛ්‍යා අතරින් සංඛ්‍යා දෙකක් අතර පොදු අන්තරය 4ක් වන සංඛ්‍යා පමණක් තෝරා රටාවක් ගොඩනගන්න.

| | | |
|---|---|---|
| 57 | 40 | 43 |
| 45 | 52 | 49 |
| 41 | 53 | 37 |

.......................................................................................... (ලකුණු 02)

(18) දී ඇත්තේ ඩොමිනෝ පත් කට්ටලයකි. එහි හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා යොදන්න. (ලකුණු 02)


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 27 | 30 × 6 | 180 | 21 × 7 | 147 | 12 × ....... | 96 | 3 × 9 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(19) ත්‍රී වීලර් 250 ක හා වීල්බැරෝ 250 ක ඇති මුළු රෝද ගණන කොපමණ ද? ..................................................
(ලකුණු 02)

(20) විනෝද චාරිකාවක් යාම සඳහා සිසුන් 232ක් පැමිණ සිටි අතර බස්රථ 4 කට සමාන ලෙස නංවනු ලැබී ය. එක් බස් රථයකට නැගි සිසුන් සංඛ්‍යාව කොපමණ ද? ..................................................................
(ලකුණු 02)


(21) මෙම රූපය තිරස් ලෙස සමමිතික රේඛාවකින් වෙන්කළ විට සෑදෙන සමචතුරස්‍ර ගණන කීය ද? ....................



(ලකුණු 02)

(22) ට්‍රැක්ටරයක පටවාගෙන ආ උළු කැට ගොඩකින් ¼ ක් බිඳී තිබුණි. එම ප්‍රමාණය 129කි. බිඳී නොතිබූ උළු කැට ප්‍රමාණය කොපමණ ද?
(ලකුණු 02)

(23) රූපසටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




(ලකුණු 02)

A ස්ථානයේ සිට D ස්ථානය දක්වා ඇති දුර කොපමණ ද?


(24) xx - ix = .................... මෙහි පිළිතුර රෝම ඉලක්කමෙන් හිස්තැනෙහි ලියන්න. (ලකුණු 02)

(25) දෙහි 1kg කින් ලබාගත් යුෂ මිශ්‍ර කර දෙහි බීම 2$l$ සෑදිය හැකි ය. දෙහි 500g කින් ගත් යුෂ මිශ්‍ර කර සෑදිය හැකි දෙහි බීම ප්‍රමාණය කොපමණ ද?

.................................................................................... (ලකුණු 02)

(26) චීත්ත රෙදි මීටරයක මිල රු.75.00 කි. සෙරෙප්පු කුට්ටමක මිල රු.450.00 කි. රෙදි මීටර 2ක් හා සෙරෙප්පු කුට්ටමක් මිල දී ගැනීමට කොපමණ මුදලක් අවශ්‍ය වන්නේ ද? ..................................................
(ලකුණු 02)

(27)



(I) සම්පූර්ණ රූපයෙන් ¾ ක් පාට කළ යුතු නම් ඒ සඳහා තව කොටස් කීයක් පාට කළ යුතු ද? ..........................................................................

(II) පාට කර දක්වන්න.

(ලකුණු 02)


(28) මිනිත්තු කටුව 12 සිට 4 ඉලක්කම දක්වා ගමන් කර ඇති විට ගත වූ කාලය විනාඩි කීය ද?

..................................................................

(ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(29) පහත දැක්වෙන්නේ සිසුන් කණ්ඩායමකගේ විනෝදාංශ පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයකි.




(ලකුණු 02))

(I) චිත්‍ර ඇඳීම විනෝදාංශ කොටගත් ළමුන් ගණන 06 කි. එම ප්‍රමාණය ප්‍රස්තාරයේ දක්වන්න.

(II) වැඩි ම සිසුන් පිරිසක් කැමති විනෝදාංශය කුමක් ද? ............................................

- **අංක 30 සිට 59 දක්වා එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) ශ්‍රී ලාංකිකයන් ගේ ජන ක්‍රීඩාවක් නොවන්නේ,

(1) චක්ගුඩු පැනීම (2) එළුවන් කෑම (3) බනිස් කෑම

(31) අප රටට ආවේණික පාන වර්ග වේ.

(1) බෙලිමල්, වරාමල් (2) පෙනෙල, පොල්පලා (3) ඉරමුසු, රණවරා

(32) වෙස්මුහුණු සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නගරයකි.

(1) බලංගොඩ (2) අම්බලන්ගොඩ (3) අම්බලන්තොට

(33) සැරසිලි නිර්මාණ කිරීම සඳහා යොදාගත හැකි පරිසර හිතකාමී ද්‍රව්‍ය වේ.

(1) පන් කොළ, ටොෆි කොළ (2) පොල් කොළ, ඉටි කොළ (3) ගොක් කොළ, තල් කොළ

(34) බීජ රාශියක් ඇති පළතුරක් නොවේ.

(1) දෙළුම් (2) රඹුටන් (3) දොඩම්

(35) කඩොලාන පරිසරයේ හැදෙන ශාක වර්ගයකි.

(1) පතොක් (2) කටුපිල (3) කිරල

(36) ශාක භක්ෂක සතුන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) හාවා, කුකුළා, කපුටා (2) එළුවා, හරකා, මුවා (3) ලේනා, නරියා, ගෙම්බා

(37) ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂයකි.

(1) මෝරා (2) දැල්ලා (3) මල් පුළුට්ටා

(38) විටමින් D ඌණතාවය නිසා අපට ඇතිවන රෝගී තත්ත්වයකි.

(1) ඇස් පෙනීම දුර්වල වීම. (2) සම ඉරිතැලීම. (3) අස්ථි ආශ්‍රිත රෝග ඇති වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(39) අපගේ ශරීරයට කැල්සියම් ලැබෙන ආහාරයකි.

(1) නෙළුම් අල (2) මුහුදු මාළු (3) සෝයා බෝංචි

(40) අතීතයේ දී තෙල් සිඳීමට භාවිත කළ උපකරණය වන්නේ,

(1) සකපෝරුව (2) සෙක්කුව (3) වරක්කලය

(41) ශක්තිය වැඩියෙන් ම වැයවන ක්‍රීඩාවක් වන්නේ,

(1) කඹ ඇදීම (2) වෙස් ඇඳීම (3) බට්ටා පැනීම

(42) රට ඉඳි වැඩිපුර ම ආහාරයට ගන්නා ජන වර්ගයකි.

(1) ද්‍රවිඩ (2) මුස්ලිම් (3) සිංහල

(43) උතුරු පළාතට හා උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,

(1) කෑගල්ල, මඩකලපුව (2) පොළොන්නරුව, යාපනය (3) කිලිනොච්චිය, අනුරාධපුරය

(44) ජලයට දැමූ විට වායු බුබුළු දැකිය හැකි ද්‍රව්‍යය කුමක් ද?

(1) වීදුරු කැබලි (2) ගඩොල් කැබලි (3) කළුගල් කැබලි

(45) දෝලාව භාවිත කර ඇත්තේ,

(1) කාලය මැනීමට (2) පණිවිඩ යැවීමට (3) ගමන් යාමට

(46) කොම්පෝස්ට් පොහොර සෑදීම සඳහා යොදාගන්නා ශාක පත්‍ර විශේෂයකි.

(1) දෙල් කොළ (2) ඇල්බීසියා කොළ (3) අක්කාපාන කොළ

(47) ආහාර කල්තබා ගැනීමේ දී ඇඹුල් තියල් කිරීම සඳහා ගන්නා මාංශ ජනක ආහාරයක් වන්නේ,

(1) සෝයා මීට් (2) පොළොස් (3) මාළු


(48) ගඩොල් කුඩු සහ දෙහි ඉස්ම යොදාගෙන ඔප මට්ටම් කළ හැකි භාණ්ඩයකි.

(1) දැව අල්මාරිය (2) පිත්තල හෙප්පුව (3) මැටි කළය

(49) බෝග වගාව කෘමීන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ස්වාභාවිකව කෘමී නාශකයක් සාදා ගතහැකි බීජ වර්ගයකි.

(1) දොඹ ඇට (2) රබර් ඇට (3) කොහොඹ ඇට

(50) පහත බඳුන තුළ ඇති බීජවලට සිදුවිය හැක්කේ,




(1) ඉක්මණින් පැළවීම.

(2) ඉක්මණින් පැළ නොවීම.

(3) කිසිසේත් පැළ නොවීම.

(51) දණ්ඩ චුම්භක දෙකක සමාන ධ්‍රැව දෙක ළං කළ විට,

(1) ආකර්ෂණය වේ. (2) විකර්ෂණය වේ. (3) කිසිවක් සිදු නොවේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(52) විනිවිද පෙනෙන බෝතලයකට පස් ස්වල්පයක් දමා ජලය පුරවා බෝතලය වසා හොඳින් සොලවා තබන්න. ඉන්පසුව බැලූ විට පතුලේ තැන්පත් වී ඇත්තේ,

(1) වැලි (2) බොරළු (3) රොන් මඩ

(53) බසවක්කුලම වැව හා මින්නේරිය වැව සාදවන ලද රජවරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) දේවානම්පියතිස්ස රජතුමා, මහසෙන් රජතුමා

(2) පණ්ඩුකාභය රජතුමා, මහසෙන් රජතුමා

(3) මහසෙන් රජතුමා, අභය රජතුමා

(54) මළකඩ සහිත ඇණයක් පාදයේ ඇණුන විට පානය කිරීමට දෙන ඖෂධීය පානයකි.

(1) රණවරා (2) වෙනිවැල්ගැට (3) කොත්තමල්ලි

(55) ක්ෂීරපායී සතෙකු වන්නේ,

(1) කබරගොයා (2) මුගටියා (3) කටුස්සා

(56) යකඩ බහුල ආහාර කාණ්ඩයට අයත් වන්නේ,

(1) මුරුංගා කොළ, නිවිති

(2) රටකජු, මස්

(3) කජු පුහුලන්, රටකජු

(57) සිදුරු කැමරාවකින් ගසක් දෙස බැලූ විට දැකිය හැකි ආකාරය වන්නේ,

(1) උඩුකුරුව ය. (2) යටිකුරුව ය. (3) සමාන්තරව ය.

(58) ශ්‍රී ලංකාවට බටහිරින් පිහිටා ඇත්තේ,

(1) ඉන්දියාව (2) මැලේසියාව (3) අප්‍රිකානු රටවල්

(59) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් පමණක් පණිවුඩ හුවමාරු කරගන්නා මාධ්‍ය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ටෙලිමේල් , පෝස්ටර් , දුරකථන

(2) ටෙලිමේල් , රූපවාහිනිය , ගුවන් විදුලිය

(3) රූපවාහිනිය , සඟරා , විද්‍යුත් තැපැල

(60) ගෙවතු වගාව මගින් අපට ආහාර සඳහා අවශ්‍ය බොහෝ දේ ලබාගත හැකි ය. කුඩා ගෙවත්තක වුවත් ඉඩකඩ ඇති පරිදි වගා කටයුතු කිරීමට අපට හැකි වේ.

" ගෙවතු වගාවෙන් අපට ලැබෙන ප්‍රයෝජන" යන මාතෘකාව යටතේ වැකි 3 ක් නිර්මාණය කර ලියන්න.

(සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(1) ..........................................................................................................................................................

..........................................................................................................................................................

(2) ..........................................................................................................................................................

..........................................................................................................................................................

(3) ..........................................................................................................................................................

..........................................................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.

5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2024

පිළිතුරු

## ප්‍රශ්න පත්‍ර අංක 03 - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) (i) | (02) (iii) | (03) (i) | (04) (iii) | (05) (ii) | (06) (i) | (07) (ii) | (08) (ii) | (09) (iii) | (10) (ii) |
| (11) (i) | (12) (iii) | (13) (iii) | (14) (ii) | (15) (i) | (16) (ii) | (17) (i) | (18) (iii) | (19) (i) | (20) (ii) |
| (21) (i) | (22) (ii) | (23) (iii) | (24) (i) | (25) (iii) | (26) (iii) | (27) (ii) | (28) (i) | (29) (iii) | (30) (i) |
| (31) (ii) | (32) (iii) | (33) (ii) | (34) (ii) | (35) (ii) | (36) (iii) | (37) (i) | (38) (iii) | (39) (ii) | (40) (ii) |

## ප්‍රශ්න පත්‍ර අංක 03 - II පත්‍රය

(01) (I) රියෝ චං (II) නව මැදිරිය (III) ඔවුන් (IV) කෙටි ඇඳපිල්ල / කෙටි ඇඳය (V) ඉසිඹුව / නැගී / හිඳගෙන / සඳහා (VI) පොත්ගුල (ලකුණු 06)

(02) (I) ×(II) ×(III) ✓ (ලකුණු 03)

(03) (I) කළහ. (II) වූහ (ලකුණු 02)

(04) පරිසරය කෙරෙහි දැක්වූ සංවේදීතාව වික්‍රමසිංහ මහතාගේ නිර්මාණකරණයේ සාර්ථකත්වය සඳහා ඉවහල් විය. (ලකුණු 02)

(05) (I) ෂ (II) ණ (III) ණ (IV) තා (V) ඡ (VI) ඵ (ලකුණු 06)

(06) (I) අපි මල් කඩා මාල හැදුවෙමු. (ලකුණු 02)

(07) (I) වණය (II) වනය (III) නල (IV) නළ (ලකුණු 04)

(08) (I) ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගෙයි (II) රයිගමයයි ගම්පළයයි වගේ. (ලකුණු 02)

(09) 'සිබිල් නැන්දා' හෙවත් සිබිල් වෙත්තසිංහ මැතිණිය එදා ඒ සිහින දුටු කුඩා දැරියයි. (ලකුණු 02)

(10) (I) Shoe Flower (II) Rainbow (ලකුණු 02)

(11) Do you have a pencil ? (ලකුණු 02)

(12) ජාතික ඇඳුම (ලකුණු 01)

(13) ආච්චිලා (ලකුණු 01)

(14) එනක්කු පසික්කිරදු (ලකුණු 01)

(15) 17 019

(16) 3026, 3100, 30106

(17) 37, 41, 45, 49, 53, 57

(18) 8

(19) 1000

(20) 58

(21) 8

(22) 387

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


(23) 325m / මීටර 325

(24) xi

(25) 1 $l$

(26) රුපියල් 600.00

(27) (i) 4 (ii)



(කොටස් දෙකක් ඉතිරි වන පරිදි පාට කර තිබේ නම්,)

(28) මිනිත්තු 20

(29) (I) 6 තෙක් ප්‍රස්තාරය අඳුරු කොට තිබේ නම්, (II) ඇවිදීම

(30) 3 (31) 3 (32) 2 (33) 3 (34) 2 (35) 3 (36) 2 (37) 3 (38) 3 (39) 2 (40) 2 (41) 1 (42) 2 (43) 3 (44) 2

(45) 3 (46) 2 (47) 3 (48) 2 (49) 3 (50) 3 (51) 2 (52) 2 (53) 2 (54) 2 (55) 2 (56) 1 (57) 2 (58) 3 (59) 2

(ප්‍රශ්න 30 සඳහා ලකුණු 30)

($1 \times 30 = 30$)

(60) රචනාව සඳහා ලකුණු $2 \times 3 = 6$

(දී ඇති උපදෙස් පරිදි ලියා ඇත්නම්)